දුරකථන / தொலைபேசி / Telephone ) 0112669192 , 0112675011 ) 0112698507 , 0112694033 ) 0112675449 , 0112675280
ෆැක්ස් / பெக்ஸ் / Fax ) 0112693866 ) 0112693869 ) 0112692913
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் முகவரி / e-mail ) postmaster@health.gov.lk
වෙබ්අඩවිය / இணையத்தளம் / website ) www.health.gov.lk

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය / எனது இல / My No. ) MA/MS/A/06/2024
ඔබේ අංකය / உமது இல / Your No. : )
දිනය / திகதி / Date ) 2024-06-13

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

**පොදු චක්‍රලේඛ ලිපි අංක: 02-92/2024**

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ජාතික රෝහල/ අධ්‍යක්ෂ, මහනුවර ජාතික රෝහල
සියළුම පළාත් / ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියළුම ශික්ෂණ/ දිස්ත්‍රික් මහ රෝහල් අධ්‍යක්ෂවරුන්,
සියළුම විශේෂිත රෝහල් හා විමධ්‍යගත ඒකකවල ප්‍රධානීන්,
සියළුම මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරීවරුන්,
අදාල අනෙකුත් සියළුම ආයතන ප්‍රධානීන්,
අදාල සියළුම වෛද්‍ය නිලධාරීන්,

**අතරමැදි ශ්‍රේණියක උපරිම වැටුප් පියවරට එළඹෙන නිලධාරීන්ට එම උපරිම වැටුප් පියවරෙන් ඔබ්බට වැටුප් වර්ධක ගෙවීම සඳහා වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2019 ශ්‍රේණිධාරි වෛද්‍ය නිලධාරීන් සඳහා ආදේශ කරගැනීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් වූ 2019-07-08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2019 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය මෙයින් යොමුකර සිටිමි.

02. එම චක්‍රලේඛයෙහි 03 වන ඡේදය අනුව ඒ දක්වාම ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත සිදුකෙරුණු අතරමැදි ශ්‍රේණියක උපරිම වැටුප් පියවරට එළඹ සිටින නිලධාරීන් හට එම උපරිම වැටුප් පියවරෙන් ඔබ්බට වැටුප් වර්ධක ගෙවීමේ බලය ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ එකඟත්වයට යටත්ව ඒ ඒ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත පැවරීමට කටයුතු කර ඇත.

03. ඒ අනුව අදාල නිලධාරීන් හට නියමිත ශ්‍රේණියට හිමි වැටුප් වර්ධක අගය මත වැටුප් වර්ධක ගෙවීම සඳහා මා වෙත අනුමැතියට යොමුකිරීමේදී යොමුගත චක්‍රලේඛයෙහි 03 වන ඡේදයේ සඳහන් කොන්දේසිවලට යටත්ව කටයුතු කළ යුතු බවට මෙයින් දන්වා සිටිමි.

04. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 බලාත්මක වන දිනය වූ 2006-01-01 දින සිට මේ දක්වා විශ්‍රාම ලබා සිටින ශ්‍රේණිධාරි වෛද්‍ය නිලධාරීන්ද ඇතුලත්ව මෙලෙස ඔවුන්ට හිමි වැටුප් වර්ධක අඛණ්ඩව ලබාදී නොමැති සියළුම වෛද්‍ය නිලධාරීන්ට සිදුව ඇති අගතිය මේ අනුව නිවැරදි කළ යුතු වේ.

05. දැනට සේවයේ නියුතුව සිටින වෛද්‍ය නිලධාරීන් සිය වත්මන් සේවා ස්ථානයේ ප්‍රධානියා මගින්ද, 2006-01-01 දින සිට මේ දක්වා විශ්‍රාම ලබා ඇති වෛද්‍ය නිලධාරීන් තමන් අවසන් වරට සේවය කළ සේවා ස්ථානයේ ආයතන ප්‍රධානියා මගින්ද සිය ඉල්ලීම ඉදිරිපත් කළ යුතු වන අතරම, ඒ සඳහා මේ සමඟින් ඇති ඇමුණුම 01 භාවිතා කළ යුතු බවට ඔවුන් දැනුවත් කරන්නේ නම් මැනවි.

**වෛද්‍ය පී. ජී. මහීපාල,**
ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය.

වෛද්‍ය පී. ජී. මහීපාල
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත් -

| | | |
|---|---|---|
| 01. පළාත් සෞඛ්‍ය ලේකම්වරුන් | - | කරු. දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| 02. ප්‍රධාන මූල්‍ය නිලධාරී, සෞඛ්‍ය අමාත්‍යාංශය | - | -එම- |
| 03. අදාල සියළුම සෞඛ්‍ය ආයතනවල ගණකාධිකාරිවරුන් | - | -එම- |

ඇමුණුම/இணைப்பு/Annexure - **01**

Through ..................................

..........................................

Secretary
Ministry of Health

Dear Sir/Madam

**Correction of Grade II Increment Anomaly**
**Dr. ..........................................**

I have been deprived of ....... increments in Grade II. Please be kind enough to take necessary steps to correct the aforesaid anomaly and place me on the correct salary step.

The details are as follows

| | | |
|---|---|---|
| 1 | Preliminary Grade Appointment Date | |
| 2 | Grade II Promotion Date | |
| 3 | Grade I Promotion Date | |
| 4 | Number of Years in Grade II | |
| 5 | Grade I Placement Salary Step | |
| 6 | Grade I Current Salary Step | |
| 7 | Number of Deprived Grade 2 Increments | |
| 8 | Current Post and Institution | |

I have not been subjected to suspension of increments on disciplinary grounds.

Thank you

...................................